# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2103/9 – 2018 දෙසැම්බර් 24 වැනි සඳුදා – 2018.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 14 දරන සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමූපකාර සේවක කොමිෂන් සභාවට සාමාජිකයින් පත්කිරීම.

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 14 දරන සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 04(2) හා 07 (01) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය, මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ඉඩම්, වෙළෙඳ හා වාණිජ, ආහාර සැපයුම් බෙදා හැරීම් කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයක් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශය යන විෂයයන් භාර අමාත්‍ය සරත් ඒකනායක වන මම මෙම නියෝගය මගින්

1. මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය 04 (2) හා 07 (01) වගන්තිය ප්‍රකාර සමූපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයෙකු හා සභාපති වශයෙන් මහේන්ද්‍ර කරපුටුගල මහතා ද,

සෙසු සාමාජිකයින් වශයෙන්

2. නීතිඥ එදිරිසිංහ ගාමිණී සමරතුංග මහතා ද,

3. වතුවල ගෙදර චමින්ද තුෂාර කමලරත්න මහතා ද

2018.06.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරමි.

සරත් ඒකනායක,
ප්‍රධාන අමාත්‍ය,
මධ්‍යම පළාත.

2018 ඔක්තෝබර් මස 08 වැනි දින,
මහනුවර, මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

01 - 56

1A – PG 4317– 17 (2018/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*